**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 06 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 07 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාව වෙත ලැබී ඇති උපලේඛණ අනුව 2012 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට ලැබිය යුතු ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.7,752,355 ක් ද 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලයට අදාලව ලැබිය යුතු උසාවි දඩ රු.3,189,424 ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම සහ වර්ෂය අවසානයට ආදායම් ණයගැති ශේෂය රු.10,941,779 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ආ) ඉකුත් වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂය තුල ලැබුනු ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.5,978,425 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඇ) ඉකුත් වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂය තුල ලැබුනු උසාවි දඩ රු.994,250 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඈ) ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති මෙතෙක් ක්‍රියාත්මක නොකළ ජල ව්‍යාපෘතියක අපේක්ෂිත වියදම රු.550,000 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබූ බැවින්, සමාලෝචිත වර්ෂයේ වියදම සහ සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.550,000 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඉ) සභාව විසින් ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.11,060,437 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය රු.12,983,676 ක් ලෙස රු.1,923,239 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සභාව විසින් ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.13,612,348 ක් වූ වියදම් ණයහිමි ශේෂය රු.14,363,862 ක් ලෙස රු.751,514 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.29,133 ක බැර අවිනිශ්චිත ගිණුම් ශේෂයක් පැවතුනි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම ව ආදායම රු.5,537,972 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,412,220 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 උනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 189 | 295 | 288 |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | බදු කුලී | 19 | 29 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 150 | 130 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,563 | 30,047 | 12,984 |

### 2.2.2 **ජල ගාස්තු**

ගල්වඩුවත්ත ජල යෝජනා ක්‍රමය යටතේ ජල සැපයුම් ලබන පාරිභෝගිකයින්ගෙන් 2011 වර්ෂයේ සිට ජල ගාස්තු බිල්කිරීම් නවතා තිබූ අතර, පාරිභෝගිකයින් 09 දෙනෙකු ගෙන් 2011 ජනවාරි 01 දිනට අයවිය යුතුව පැවති රු.36,995 ක් ද අයකර ගෙන නොතිබුණි.

### 2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථානමාරුවීම් ලැබූ හා විශ්‍රාම ලැබූ සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.45,663 ක් වූ ණය මුදල් ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4:6 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකරගෙන නොතිබුණි.

(ආ) සභාවේ සේවය කර විශ්‍රාම ලැබූ නිලධාරිනියකට 2009 නොවැම්බර් 16 දින සභා අරමුදලින් ගෙවා තිබූ රු.482,522 ක විශ්‍රාම පාරිතෝෂිකයෙන් රු.212,599 ක් 2013 ජූනි මස වන විටද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා ඇති අවස්ථා 18 කදී තැන්පත් කරන ලද රු.43,150 ක් වූ තැන්පත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) ලිපිය ප්‍රකාරව සභාව විසින් අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැසමක් සහ එයට අනුකුලව වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය